මෙරට සංචාරය සඳහා පැමිණි ස්පාඤ්ඤ කාන්තාවකට ලිංගික අතවර කළ තරුණයන් පිරිසක් කයිට්ස් පොලිසිය විසින් අත්අඩංගුවට ගත් පුවතක්, අරුණ පුවත්පත (සැප්.26, 2022) මගින් වාර්තා කර තිබිණි.

එම පුවත අරුණ පුවත්පත මගින් දක්වා තිබුණේ, "ලාංකීය පෙම්වතාට පහරදී ස්පාඤ්ඤ රූමතියට අතවර කළ 13ක් කයිට්ස් පොලිසියෙන් අල්ලයි" යන සිරස්තලයෙනි. පුවත් අන්තර්ගතය තුළ ද එම විදෙස් කාන්තාව "රූමත්" බව සඳහන් කර තිබිණි.

1) ඔබ සිතනා ලෙසට, එම සිදුවීමට අදාළ කාන්තාවගේ බාහිර ස්වරූපය පුවතට අදාළ වන්නේ ද? එසේ අදාළ නොවන්නේ නම්, "රූමතිය", "රූමත්" වැනි විශේෂණයන් යොදාගනිමින් එකී කාන්තාවගේ බාහිර ස්වරූපය පුවතෙහි දක්වා ඇත්තේ මන්ද?

2) එය, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගනිමින් ඒකාකෘතික කිරීම් ප්‍රවර්ධනය කිරීමක් මෙන්ම, ලිංගික අතවර සිදුවීමකට භාවාතිශය බවක් එක් කිරීමක් ද නොවන්නේ ද?

පුවතකට අදාළ නොවන බාහිර රූපය ඉස්මතු නොකරමු!